**උතුරු පළාත් සභාව – 2021**

------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

උතුරු පළාත් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2022 නොවැම්බර් 09 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 දෙසැම්බර් 06 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර උතුරු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

**1.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**---------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී තුළ ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීමේ වියදම් රු. 253,384,916ක් ජංගම නොවන වත්කම් ප්‍රකාශනය යටතේ ප්‍රාග්ධනිත කර නොතිබීම නිසා ජංගම නොවන වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව 2017 වර්ෂයේ සිට මෙම පිළිවෙත අනුගමනය කරනු ලබන අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර චක්‍රලේඛ මගින් අවශ්‍ය සංශෝධන සිදුකරන ලෙසට උපදෙස් ලබාදී ඇත. | ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීමේ වියදම් ජංගම නොවන වත්කම්වල නියමිත කාලපරිච්ඡේදයේ ඇතුළත් කිරීමට නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | රු. 30,146,459ක් වූ බැරකම්, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ බැරකම් හා බැඳීම් ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි. | අතැති බිල්පත් පදනම් කරමින් පිළියෙල කිරීම සහ දෙසැම්බර් මාසයට අදාල බිල්පත් ඊළඟ වර්ෂයේ ජනවාරි අවසානයේ ලැබීමට නියමිත බැවින් ඒවා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | සියළුම බැරකම් නියමිත පරිදි ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ රු.823,615ක ජංගම නොවන වත්කම් උපලබ්ධි කර තිබුණි. නමුත්, ජංගම නොවන වත්කම් ප්‍රකාශනයේ ගැලපීමට පියවර ගෙන නොතිබුණි. | සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අදාල රු.783,005ක් දෝෂයකින් ACA-6 හි දක්වා තිබුණි. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - සැලැසුම් කාර්යාලයේ ජංගම නොවන වත්කම් රු.40,610කට විකුණා තිබූ නමුත් දෝෂයකින් විකුණුම් වටිනාකම දැක්වීම නිසා මෙම දෝෂය සිදුවී ඇත. | ජංගම නොවන වත්කම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | පළාත් ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතු රු. 2,987,802ක ජංගම නොවන වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අඩුවෙන් අනාවරණය කර තිබුණි. | ස්ථාවර වත්කම් වාර්තාව පරිදි විචලනයන් සඳහා හේතු නිවැරදි කර මෙම ප්‍රකාශවල නොසැසඳීම් නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ප්‍රවර්තන වර්ෂයේ කටයුතු කෙරේ. | -එම- |
| (ඉ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු 2021 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල වටිනාකම හා සිගාස් මෘදුකාංග වාර්තාව අනුව එදිනට එම වත්කම්වල වටිනාකම අතර රු.5,351,156,079ක නොසැසඳුණු වෙනසක් පැවැතිණි. | -එම- | -එම- |
| (ඊ) | වාහන 11ක අනතුරු සම්බන්ධයෙන් රක්ෂණ ආයතන මගින් ප්‍රතිපූර්ණය කර නොතිබුණු රු. 9,944,632ක පාඩුව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද සටහන් (i) සහ (ii) හි දක්වා නොතිබුණි. | පාඩු ලේඛනය යාවත්කාලීන කිරීම පිළිබඳව උපදෙස් ලබාදී මේ වන විට ඒවා නිවැරදි කර ඇත. 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සටහන් (i) සහ (ii) හි අනාවරණය කරනු ලැබේ. | පාඩු සහ හානි මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව අනාවරණය කළයුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව උතුරු පළාත් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම, වංචාවක් ඇති විමට හේතුවේ.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරමි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 411 - පළාත් ගොවිතැන්, කෘෂිකාර්මික සේවා, පශු සම්පත් සංවර්ධන වාරිමාර්ග ධීවර ජලජ සම්පත් අමාත්‍යාංශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| කර්මාන්ත දෙකක ඉදිකිරීම් කාර්යයන්, ගිවිසුමේ සඳහන් කාලය තුළ අවසන් නොවී පැවැතුණද, එයට සාපේක්ෂව එහි කාර්යසාධන ඇප බැඳුම්කරයේ කාලය දීර්ඝ කිරීම් ලබානොගැනීම හේතුවෙන් රු.663,700ක් වටිනා කාර්යසාධන ඇප බැඳුම්කරය ආදායමට මාරු කිරීමට නොහැකි වී තිබුණි. | ධර්මකේනි මාර්ගය ප්‍රතිසංස්කරණයේ කටයුතු වෙනුවෙන් තවදුරටත් ගෙවිය යුතුව පවතින බැවින් ඇප මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවා ඇත. පච්චිලෙයිපල්ලි ආයුර්වේද රෝහල සඳහා කාර්යසාධන ඇප බැඳුම්කරය කාලය දීර්ඝකර | කොන්ත්‍රාත් පිරිනැමීමේදී ඇප සුරක්ෂණ නියමිත කාල වකවානු තුළ ලබාගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලබාදෙන ලෙසට ඉල්ලීම් කර තිබුණද, කොන්ත්‍රාත්කරු විසින් අවබෝධතා පදනමින් කාර්යය අවසන් කිරීමට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. | |

**1.5.2 ශීර්ෂය 431 - පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.1.4 මාර්ගෝපදේශයට පටහැනිව ඇස්තමේන්තුගත පිරිවැය රු. 62,250,000ක් වූ කර්මාන්ත 11ක් වෙනුවෙන් ලංසු ලිපිලේඛන නිකුත් කර තිබුණද, ඒ හා සම්බන්ධ ලේඛන පවත්වා නොතිබුණි. | ලංසු ලිපිලේඛන නිකුත් කිරීම සම්බන්ධ ලේඛන වර්තමානයේ පවත්වනු ලැබේ. | නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන අනුගමනය කිරීම තහවුරු කළ යුතුය. |
| (ආ) | ඉදි කිරීම්, පුහුණු හා සංවර්ධන ආයතනය (ICTAD) මගින් ප්‍රකාශිත ICTAD/SBD/03 ලේඛනය 01 වගන්තිය 04 ඡේදයේ විධිවිධානවලට පටහැනිව, ඉදි කිරීම්, පුහුණු හා සංවර්ධන ආයතනයේ වලංගු ලියාපදිංචියක් නොමැති කොන්ත්‍රාත්කරුවෙකුට රු.2,160,207ක් වටිනා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කිරීමට පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව පියවර ගෙන තිබුණි. | Covid 19 හේතුවෙන් රටෙහි පැවැති අයහපත් වාතාවරණය, කාර්යයන් ඉටුකිරීම සහ රජයේ අරමුදල් ඵලදායීව උපයෝජනය කළයුතු බවත් සැලැකිල්ලට ගෙන ඉහත කාර්යය අවම ලංසුකරුට පිරිනමන ලදි. | නියමිත ලේඛනයේ විධිවිධාන අනුගමනය කළයුතුය. |
| (ඇ) | ව්‍යාපෘති 08ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 18,261,241ක් වැයකර තිබුණද, එම ව්‍යාපෘති සියල්ල අවසන් නොකර අත්හැර දමා තිබුණි. | රටෙහි පැවැති කොරෝනා වසංගතය සහ අයහපත් වාතාවරණය හේතුවෙන් මුළුමනින්ම අවසන් කර, ඒ සඳහා අවසාන ගෙවීම් නියමිත මූල්‍ය වර්ෂය අවසන් වීමට ප්‍රථම සිදුකළ නොහැකි විය. අදාල අරමුණු ඉටුකළ හැකි අයුරින් ඉදිරි වර්ෂයේදී අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති අතර අදාල ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක නොකර අත්හැර දමා නොමැත. | මුලින්ම සිදුකළ යුතු කාරණා හඳුනාගෙන කාර්යයන් අවසන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | පුලුදියාරු වැවෙන් උස් ගොවිබිම් සඳහා වාරි යෝජනා ක්‍රමය (lift irrigation) වෙනුවෙන් රු. මිලියන 32ක් වැයකර 2015 වර්ෂයේදී වැඩ නිමකර තිබුණද, මේ දක්වාම එම ව්‍යාපෘතිය උපයෝජනය කර නොතිබුණි. | 2016 වර්ෂයේදී ප්‍රතිසංස්කරණය කිරිමෙන් පසුව නිල වශයෙන් එවකට ප්‍රධාන අමාත්‍යවරයා විසින් අදාල සංවිධාන වෙත නිල වශයෙන් භාරදෙන ලදි. ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසුව වර්තමානය දක්වා අදාල ව්‍යාපෘතිය සම්බන්ධ අත්‍යාවශ්‍ය හදිසි තාක්ෂණික උපදෙස් ලබාදෙමින් පවතී. | ව්‍යාපෘති නිමකිරිමට ප්‍රථම නියමිත පරිදි ශක්‍යතා අධ්‍යයනය සිදුකළ යුතුය. |

**1.5.3 ශීර්ෂය 450 - පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

| | විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | වෛද්‍ය නිලධාරී සේවයේ පළමු ශ්‍රේණියට අයත් නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන පන්තිය යටතට ගැනෙන වෛද්‍ය අධිකාරි තනතුර දරන වෛද්‍ය නිලධාරියෙකුට අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව වෙන්කරන ලද වාහනය සඳහා ලබා දෙන මාසික ගමන් වියදම් දීමනාව වෙනුවෙන් 2015 නොවැම්බර් මාසයේ සිට 2020 ජූලි මාසය දක්වා රු.3,599,640ක් ගෙවීම් කර තිබුණි. | ලබාදුන් අවිධිමත් මාසික ගමන් වියදම් දීමනා රු. 3,599,640ක් අදාල නිලධාරීගෙන් අයකර ගැනීමට පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරයාට සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ලිපි යවා ඇත. අයකළ පසු ඔබ වෙත දැනුම් දෙනු ලැබේ. | අවිධිමත් ගෙවීම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | පේදුරුතුඩුව රෝහලේ 2016 ඔක්තෝබර් මාසයේදී ස්ථාපිත කළ රු. මිලියන 8ක් වූ දාහක යන්ත්‍රය (Incinerator) ප්‍රමාණවත් ආරක්ෂාවක් නොතිබීම, වගකීම් කාලයෙන් පසු නිසි ලෙස නඩත්තු නොකිරීම සහ නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ස්ථාපිත කිරීම හේතුවෙන් අක්‍රිය තත්ත්වයට පත් වී තිබුණි. | දාහක යන්ත්‍රය වෙනත් ස්ථානයකට මාරුකිරීමට ප්‍රයත්න දැරූ නමුත්, මහජන විරෝධතා හේතුවෙන් වෙනත් ස්ථානයක් මේ දක්වා ලැබී නොතිබුණි. එනමුත්, එම යන්ත්‍රය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට ප්‍රථම විධිමත්ව ශක්‍යතා අධ්‍යයනයන් සිදුකළ යුතුය. |
| (ඇ) | පිරිනමන ලද කාර්යයන් 02ක් භාර නොගත් ලංසුකරුවන්ගේ රු. 83,000ක් වූ ලංසු සුරක්ෂණය අවලංගු කර රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | Covid 19 වසංගතයේ බලපෑම අධික වීම හේතුවෙන් රට පුරා දිස්ත්‍රික් අතර සංචරනයට බාධා පැමිණවීම නිසා රජයේ ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබූ බව දන්වා සිටිමි. | ආදායම් අහිමි වීමට හේතු විමසා ආදායම් අහිමි වීම් නිවැරදි කර ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ලංසුකරුවකු කාර්යය ඉටුකිරීමට අපොහොසත් වූ විටෙක කාර්යසාධන ඇපකරය (Performance Security) නියමිත කාලපරිච්ඡේදය තුළ ආදායමට මාරුකළ යුතු බවට 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (අ) මාර්ගෝපදේශයට අනුව කාර්යාලය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බැවින් රජයට ලැබිය යුතුව තිබූ රු. 228,000ක ආදායමක් අහිමි වී තිබුණි. | පිරිනැමීමේ ලිපිය ප්‍රකාරව කාර්යය ආරම්භ කළයුතු දිනය 2021.08.18 වශයෙන් සඳහන් කර 2021.09.15 දින විධිමත් දැනුම්දීමට අනුව කාර්යය නැවැත්වීම නිසා අදාල සැපයුම්කරුගේ කාර්යසාධන ඇපකරය රු. 228,000ක් අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | -එම- |
| (ඉ) | (i) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (ආ) මාර්ගෝපදේශයට අනුව කොන්ත්‍රාත්තුවක් නිම කිරීමට නියමිත දින සිට ඉදිරියට දින **28**ක් දක්වා කාර්යසාධන සුරක්ෂණ ලබාගත යුතු වුවද, ඇස්තමේන්තු වටිනාකම රු. 91,710,849ක ඉදි කිරීම් කර්මාන්ත 20ක් සඳහා කොන්ත්‍රාත්තුව අවසන් වන දින දක්වා පමණක් වලංගු වන පරිදි කාර්යසාධන සුරක්ෂණ ලබා ගෙන තිබුණි. | කාර්යසාධන සුරක්ෂණය දෝෂයකින් කාර්යය අවසන් වන දින දක්වා ලබාගෙන තිබුණි. ඉදිරියේදි දින 28ක් වැඩියෙන් කාර්යසාධන ඇප සුරක්ෂණය ලබාගනු ලැබේ. | නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන අනුගමනය කිරීම තහවුරු කළ යුතුය. |
| | (ii) ඇස්තමේන්තුගත පිරිවැය රු. 6,722,540ක් වූ රෝහල් සඳහා වියළි ආහාර සැපයීමේ ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි ලබාගත යුතු සියයට 10ක කාර්යසාධන සුරක්ෂණයට වඩා රු.336,127ක් අඩුවෙන් ලබාගෙන තිබුණි. | වර්තමානයේ සියයට 10 කාර්යසාධන සුරක්ෂණ ලබාගනු ලැබේ. | -එම- |
| | (iii) ඇප සුරක්ෂණ රහිතව රු. 41,931,033ක් වටිනා භාණ්ඩ **07**ක් මිල දී ගැනීම සඳහා කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි. | ඉදිරි කාලයේ භාණ්ඩ මිලදී ගැනීමේදි කාර්යසාධන සුරක්ෂණය ලබාගැනීමට උපදෙස් ලබාදී ඇත. | -එම- |
| (ඊ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.1.4 මාර්ගෝපදේශයට පටහැනිව අදාල දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තුගත පිරිවැය රු.369,299,000ක් වූ කර්මාන්ත 05ක් වෙනුවෙන් ලංසු ලිපිලේඛන නිකුත් කර තිබුණ ද, ඒ හා සම්බන්ධ ලේඛනයක් පවත්වා නොතිබුණි. | ලංසු ලිපිලේඛන නිකුත් කිරීමේ ලේඛන පවත්වා ගෙන යනු ලැබේ. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ද) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 (ආ) මාර්ගෝපදේශයට අනුකූලව පිරිනැමීමේ ලිපිය ලංසු වලංගු කාලය තුළ දී ලබා දිය යුතු වුවද, ඇස්තමේන්තුගත පිරිවැය රු. 1,620,000ක් වූ කොන්ත්‍රාත්තුවක් වලංගු කාලය ඉකුත් වී දින 03කට පසු නිකුත් කර තිබුණි. | අධික වැඩ හේතුවෙන් සහ චක්‍රීය ක්‍රමයට නිලධාරීන් හුදකලා කිරීමේ මධ්‍යස්ථාන වෙත පැමිණීම නිසාත් මෙම කාර්යයට අදාල පිළිගැනීමේ ලිපිය නියමිත කාලය තුළ යැවීමට නොහැකි විය. | -එම- |
| (දු) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශයට පටහැනිව ගිවිසුම් අත්සන් නොකර එකතුව රු. 43,436,553ක් වූ ප්‍රසම්පාදනයන් 08ක් ක්‍රියාත්මක කර තිබුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදන අත්පොත සහ මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශයට අනුව භාණ්ඩ මිලදී ගැනීම සඳහාත් ගිවිසුම් ක්‍රියාත්මක කරන ලෙසට උපදෙස් ලබාදී ඇත. | -එම- |
| (එ) | ඉදි කිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය (ICTAD) මගින් ප්‍රකාශිත ICTAD/SBD/03 ලේඛනයේ 01 වගන්තියේ 30 ඡේදය ප්‍රකාරව කොත්‍රාත්තුව පිළිගැනීමේ ලිපිය නිකුත් කර දින 28ක් ඇතුළත ගිවිසුම්ගත වියයුතු වූවද, ඊට පටහැනිව එකතුව රු. 13,677,000ක් වූ කොන්ත්‍රාත් 04ක ගිවිසුම් අත්සන් කිරීම දින 06ත් දින 38ත් අතර කාල ප්‍රමාදයකින් පසුව ගිවිසුම් අත්සන් කර තිබුණි. | Covid– 19 පැතිරීම සහ අංක 3/2021 දරන චක්‍රලේඛය ප්‍රකාරව රජයේ කාර්යාලවල රාජකාරි සීමිත ලෙස ක්‍රියාත්මක වීම හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව තාක්ෂණික, ඇගැයීම් කාර්යයන් ප්‍රමාදවීම හේතුවෙන් ප්‍රමාදයන් සිදුවිය. | අදාල ලේඛනයේ විධිවිධාන ප්‍රකාරව අනුගමනය කිරීම තහවුරු කළ යුතුය. |
| (ඒ) | ඉදි කිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය (ICTAD) මගින් ප්‍රකාශිත ICTAD/SBD/03 ලේඛනයේ 01 වගන්තියේ 31 ඡේදය ප්‍රකාරව කොත්‍රාත්තුව පිළිගැනීමේ ලිපිය නිකුත් කර දින 14ක් ඇතුළත කාර්යසාධන සුරක්ෂණය ලබා ගත යුතු බව සඳහන් වූවද, රු.126,792,770 ක් වටිනා කොන්ත්රාත්තු 12ක කාර්යසාධන සුරක්ෂණ ලබා ගැනීම දින 02ත් දින 52ත් අතර කාල පරාසයකින් ප්‍රමාද වී තිබුණි. | පිළිගැනීමේ ලිපි භාරගත් කොන්ත්‍රාත්කරුවන් විසින් කර්මාන්තය ආරම්භ කිරීමේ මූලික වැඩකටයුතු වැඩ බිමෙහි ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත්, කාර්යසාධන ඇප සුරක්ෂණය ප්‍රමාද වී ගෙවා තිබුණි. | -එම- |
| (ඔ) | වාහන 14ක් අලුත්වැඩියා නොකිරීම නිසා හෝ වාහන ලියාපදිංචි සහතිකය නොමැති වීම නිසා අභාවිතව පැවැතුණි. එමෙන්ම, සමාලෝචිත වර්ෂය තුළ සිදු වූ වාහන අනතුරු 04ක් වෙනුවෙන් මූලික පරීක්ෂණ මේ දක්වා පවත්වා නොතිබුණු නමුත් පසුගිය වර්ෂවල සිදුවූ අනතුරු 04ක් සම්බන්ධයෙන් මේ දක්වාම අවසාන පරීක්ෂණ නිම වී නොතිබුණි. | වාහන 04ක් අළුත්වැඩියා නොකිරිම පිළිබඳව විමසා ඇත. වාහන 02ක් සහ ත්‍රිරෝද රථ 07ක හිමිකාරිත්වය පැවැරීමේ ලේඛන මෝටර්රථ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. වාහන 02ක් සඳහා විධිමත් පරීක්ෂණ සඳහා පියවර ගෙන ඇත. වාහන 03ක් සඳහා මූලික විමර්ශන වාර්තා අවසාන කර ඇත. තවත් වාහන 03ක් සඳහා මූලික විමර්ශන | වාහන අළුත්වැඩියා කිරීමට උචිත ක්‍රියාමාර්ග ගතයුතු අතර විමර්ශන කටයුතු මුදල් රෙගුලාසි සහ ආයතන සංග්‍රහය ප්‍රකාරව නියමිත කාලය තුළ සිදුකළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| | | කටයුතු කඩිනමින් අවසන් කිරීමට උපදෙස් ලබාදී ඇත. තවද, එක් වාහනයක් මුළුමනින්ම හානියට පත්වීම නිසා රක්ෂණ ආයතනයට භාරදී ඇත. | |
| (ඕ) | අනුමත කාර්ය මණ්ඩලයේ එකතුව 1127ක් වූ පරිපූරක හා සහායක සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ බඳවා ගැනීම් පරිපාටි මේ දක්වා යාවත්කාලීන කර නොතිබුණි. | තනතුරු 07ක් සඳහා සේවා ව්‍යවස්ථාව අනුමත කර ඇත. අනෙකුත් ඒවා සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | සේවා ව්‍යවස්ථාව/ බඳවා ගැනීම් පරිපාටි ආදිය යාවත්කාලීන කිරීමට පියවර ගත යුතුය. |
| (ක) | අනුමත වෛද්‍ය කාර්ය මණ්ඩලයේ තනතුරු 865කින් පුරප්පාඩු 113 පැවැතිණි. | මන්නාරම දිස්ත්‍රික්කයේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 32ක් දක්වා අඩුවී ඇත. යාපනය දිස්ත්‍රික්කයේ පුරප්පාඩු 7ක් පවතී. | පුරප්පාඩු පිරවීමට සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ග) | හෙද නිලධාරී කාර්ය මණ්ඩලයේ තනතුරු 1119කින් පුරප්පාඩු 188ක් පැවැති අතර ඉන් පුරප්පාඩු 87ක් යාපනය දිස්ත්‍රික්කය තුළ පැවැතුණි. | හෙද නිලධාරී කාර්ය මණ්ඩලයේ පත්වීම් ලබාදීම හේතුවෙන් පුරප්පාඩු 126ක් දක්වා අඩුවී තිබුණු අතර යාපනය දිස්ත්‍රික්කයේ එය 58ක් දක්වා අඩුවී තිබුණි. කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ අතිරික්ත හා පුරප්පාඩු කාර්ය මණ්ඩල නිරවුල් කර ඇත. | -එම- |

**1.5.4 ශීර්ෂය 460 - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | කොට්ඨාශ සහ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරුවල පුරප්පාඩු, විදුහල්පති සේවයේ 30 දෙනෙකුගෙන් සහ ගුරු සේවයේ 15 දෙනෙකුගෙන් සම්පූර්ණ කර තිබුණි. | මෙම නිලධාරීන්ගේ කාර්යභාරයන් අත්‍යවශ්‍ය වේ. එමනිසා, මෙම රාජකාරි ඉටුකළ හැකි අධ්‍යාපන පරිපාලන සංවිධානයේ ඊළඟ මට්ටමේ සේවයට අයත් රාජකාරි ආවරණය කිරීමේ පදනමින් පත්කර ඇත. | පුරප්පාඩු පිරවීමට සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | අනුමත පාසැල් මුරකරු කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව 507කින් පුරප්පාඩු 224ක් පැවැති අතර නිසි අනුමැතියක් රහිත කම්කරුවන් 06 දෙනෙකු පාසල් කාර්ය මණ්ඩලයට ඇතුළත් කර තිබුණි. | මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛයට අනුකූලව නව පත්වීම් ලබාදීම අත්හිටුවා ඇත. | -එම- |
| (ඇ) | එකතුව රු. මිලියන 26.81ක් වටිනා නව නේවාසිකාගාර 05 ක් ඉදිකර විදුලිය සහ ගෘහ භාණ්ඩ නොමැති වීම හේතුවෙන් ඉකුත් වර්ෂ 03 සිට වර්ෂ 05 දක්වා කාලයක් භාවිතයට ගෙන නොතිබුණි. | ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපදෙස් ලබාදී ඇත. | නිෂ්කාර්යව පවතින වත්කම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය |

## 1.5.5 ශීර්ෂය 481 - පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ඉඩම් සංවර්ධන ආඥා පනතේ 464 පරිච්ඡේදයේ 19(2) වගන්තිය අනුව ග්‍රාම නිලධාරී වසම් 32ක් වෙනුවෙන් සකස් කළ ඉඩම් බලපත්‍ර 702ක් හා ග්‍රාම නිලධාරී වසම් 27 ක් වෙනුවෙන් සකස් කළ ප්‍රදානපත්‍ර 243ක් අදාළ ප්‍රතිලාභීන් වෙත බෙදානොහැර 2014 වර්ෂයේ සිට කරච්චි ලේකම් කාර්යාලයේ රඳවාගෙන තිබුණි. | නියමිත ඉඩම් ලේඛන මාසයක කාලයක් ඇතුළත ලබාදීමට ක්‍රියාමාර්ග ගනු ලබන අතර ප්‍රදාන පත්‍ර සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගෙන මසක් ඇතුළත හිමිකරුවන්ට නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | බෙදානොහැර පවතින ඉඩම් බලපත්‍ර සහ ප්‍රදානපත්‍ර සම්බන්ධයෙන් උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක් විසින් ව්‍යාපාරික අරමුණු වෙනුවෙන් අයකරගත යුතු වර්ෂයකට වඩා පැරණි හිඟහිටි ඉඩම් බදු කුලී රු. 21,407,487ක් අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි. | ලැබිය යුතු එකතුව රු. 24,887,109 ක බදු කුලිවලින් මෙම වර්ෂයේදී රු.1,290,222ක් අයකර ඇත. ඉතිරි මුදල් අයකර ගැනීමට අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මාර්ගයෙන් කටයුතු කර ඇත. | අයකර නොගත් හිඟහිටි මුදල් ලබාගැනීමට උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.5.6 පළාත් මූල්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | වෙනත් රාජ්‍ය ආයතනවලට ස්ථාන මාරුවීම් ලද නිලධාරීන් 30 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 02කට වඩා පැරණි රු. 3,467,619ක ණය ශේෂයක් පැවැතිණි. | 2022.05.31 දිනට නිලධාරීන් 30කගෙන් අයවිය යුතු හිඟහිටි ණය ශේෂය රු. 2,711,245ක් දක්වා අඩු වී ඇත. එසේම, මෙම ශේෂයත් අයකර ගැනීමට ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත. | හිඟහිටි ණය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සේවය හැර ගිය, මිය ගිය, විශ්‍රාම ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් 71 දෙනෙකුගෙන් රු. 5,651,631ක හිඟ ණය මුදල අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට ගත් ක්‍රියාමාර්ග හේතුවෙන් මේ වන විට ඉහත සඳහන් කාණ්ඩයට අයත් නිලධාරීන් 58ගෙන් අයකළ යුතු ශේෂය රු. 4,066,699ක් දක්වා අඩුවී ඇත. | -එම- |
| (ඇ) | වැය විෂයන් 05ක ප්‍රතිපාදන ඉක්මවා රු. 23,987,770ක බැරකම් සඳහා බැඳීම් ඇතිකර ගෙන තිබුණි. | COVID – 19 වසංගතය හේතුවෙන් අනපේක්ෂිත නව වියදම් සහ වියදම් වැඩිවීම වර්ෂාවසානයේ සිදුවීමත් සහ ලැයිස්තුගත නොකළ මෙහෙයුම් ඉදිරි වර්ෂයේ අරමුදල් අපේක්ෂාවෙන් වගකීම් ලෙස වර්ෂ අවසාන ගිණුම්වල දක්වා ඇත. | අයවැය පාලනය නිසි අයුරින් අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ආදායම් සංකේත 12කින් රු. 313,483,834ක අපේක්ෂිත ආදායම් රැස්කර නොතිබුණු අතර එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 13ත් සියයට 63ත් අතර පරාසයක විය. | COVID –19 වසංගතය හේතුවෙන් රට වසා දැමීම, ආර්ථික කටයුතු මත බලපෑම රජයේ ආදායම් දර්ශකයන්හි සියයට 13 සිට සියයට 63ක් දක්වා රු. 313,483,834ක් එකතු කර නොතිබුණි. | පළාත් මූල්‍ය රෙගුලාසි සහ අදාල චක්‍රලේඛවලට අනුකූලව රජයේ ආදායම් ඇස්තමේන්තු කිරිම උපරිම මට්ටමින් පිළියෙල කළ යුතුය. |
| (ඉ) | එකතුව රු. 80,855,814ක් වූ පළාත් පාලන ආයතනවලට අයත් මුද්දර ගාස්තු වර්ෂ 02කට අධික කාලයක සිට අදාල පළාත් පාලන ආයතන විසින් ඉල්ලීම් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී පළාත් භාණ්ඩාගාරය විසින් පළාත් සභාවේ ආදායමට මාරු කර තිබුණි. | උතුරු පළාත හැර අනෙකුත් පළාත් ඉඩම් ලියාපදිංචි කිරීම්වලින් ලබාගැනීම ප්‍රමාදවීම් සිදුවී තිබුණි. ප්‍රතිපූරණ ඉල්ලීම් ඉදිරිපත් කර මෙම මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණය කරගැනීමට ක්‍රියාමාර්ග පළාත්පාලන ආයතන විසින් සිදුකරමින් පවතී.. | පළාත් පාලන ආයතනවලට හිමි මුදල හඳුනාගත හැකි අයුරින් වන ක්‍රමවේදයක් සකස් කර අදාල ආයතනවලට නිකුත් කිරිමට ක්‍රියාමාර්ග ගත යුතුය. |